# විශ්වජිත් සන්දේශ් සූරියබණ්ඩාර

**සන්නස වෙනුවෙන්ම ලියන ආදරණීය ම නවකතාව**



# සිහිනයක් වගේ.... 8

ඔහු සිනාසෙමින් ඇය දෙස බැලුවේ ය. ඒ සිනාවේ බොහෝ දේ සැඟවී තිබුණි. ස්නේහාට හිතුණේ එහෙමය. බොරු කියන්නට තමා ඒ තරම් දක්ෂ නැති බව ඈ දනියි.

## ස්නේහාගේත් අකලංකගේත් කතාව



මහ බෝගහෙන් වැටී ඇති බෝ කොල වලින් ගුරු පාර හැඩි වී ඇත. වියළි බෝ කොළ සුළඟ සමගින් ඒ මේ අත පාව ගොස් පාර දෙපැත්තේ ගොඩ ගැසෙයි. කන්දේ සිට හමා එන සුළඟ ගතට සිසිලසක් ගෙන දෙයි.

"තාමත් සමාජ සේවෙ කර කර ඉන්නවා මිසක් තමන් ගැන හිතන්න පටන් ගත්තෙ නෑ නේද?"

ස්නේහාගේ ප්‍රශ්නයට ඉසුර තවමත් පිලිතුරක් දුන්නේ නැත. නෝක්කාඩුවක් සේ කීවා විනා ස්නේහා පිළිතුරක් බලාපොරොත්තුවුණේ ද නැත. දෙන්නට පිළිතුරක් ඔහු ළඟ නැති බව ඇය දනියි. ස්නේහාගේ ගමන් මල්ල කරේ දමාගත්වනම ඔහු ඇය හා එක පෙළට ගමන් කරමින් සිටින්නේ ඒ ප්‍රශ්නය නෑසුණා සේ ය.

"සුගතදාස මාමා දන්නවද නංගි අද එන බව?" ඉසුර අසයි.

"තාත්තට කිව්වෙ නැහැ.. හදිසියෙම හිතිල ආවෙ" ස්නේහා කීවා ය. තාත්තාට කියලා ආවා නම් ඔහු ඇය එන මගට එනු ඇති බව ඇය දනියි. ඔහුට ඒ කරදරය කරන්නට ඇයට නොසිතෙයි. අද උදේ සිදුවූ සිදුවීම් අතරේ තාත්තාට කතා කරන්නට තරම් වන නිනව්වක් ඇයට නොවී ය. සිදුවූයේ හීනෙකින් වත් සිතූ දෙයක් ද? ඇයට සුසුමක් හෙලුණි.

"නංගි මොකක් හරි කරදරයකින් නෙවෙයි නේද ඉන්නෙ?" ඉසුර අසන්නේ ඔහුට යමක් දැනෙන නිසා ය. ස්නේහා පිලිතුරක් නොදෙයි.

"පාර හොඳටම අබලන් වෙලා.. ගංසභාවෙන් හදන්නෙ නැහැ සල්ලි නැතෙයි කියලා.. අපි තරුණ සමිතියෙන් පාර හදන්න කතා කරගත්තා.. නංගි ආ එක හොඳයි.. ඔයා ටික දවසක් ඉනනවානං අපට උදව් කරන්න ඔයාට පුලුවන්.." ඔහු කියන්නේ කතාව වෙනත් පැත්තකට හරවන්නට බව ස්නේහාට සිතුණි. ඒකට කමක් නැත. කරගෙන ආ කතාව දිගටම කරගෙන යන එක හිතට හරි නැති වැඩකි. ඉසුර රසසසාවකට නොයන්නෙ ආසාවට නොවන බව ඇය දනියි. රස්සාවක් හොයා ගන්නට ඕනෑකමක් තිබූ පමණින් රස්සාවල් ලැබෙන්නේ නැත.

"මං මේ පාර ටික දවසක් ඉන්න තමයි අයියෙ කල්පනා කරගෙන ආවෙ.. මාත් එන්නං ඔයාලට උදව් කරන්න.. ගෙදර ඉඳගෙන කරන්නයි කියල වැඩක=ත් නෑනෙ මට.."

ඉසුරගේ මුවේ නැගෙන්නෙ සතුටු සිනාවකි. "වැඩක් නොකළත් කමක් නෑ.. ඔයා ළඟපාතක ඉන්නවා නං අපට ඒ ඇති.." ඔහු කියන්නේ ඇත්තටමය. තරුණ සමිතියෙන් ඉදිරියට කරන්නට බලාපොරොත්තුවන වැඩ සටහන් පිලිබඳව ඔහු කළ දිග විස්තරයට සවන් දීගෙන ආ බැවින් වත්තේ කඩුල්ල ළඟට එනතෙක්ම ඇයට නිනව්වක් නොවීය. තාත්තාට ඇත්ත කියන්නට හැකියාවක් නොමැති කම ගැන ඇතිවූ බලවත් දුක කඩුල්ල පනින අතරේ ඇගේ සිත වේදනාවට පත් කළේ ය.

"නංගි ලොකු කල්පනාවක ඉන්නෙ.." ඇය කඩුල්ල පනින තෙක් බලා සිටි ඉසුර කීවේ ය "... ඇත්ත කියන්න.. මං මාමට කියන්නෙ නෑ.. වැඩකරන තැන මොකක් හරි ප්‍රශ්නයක් නිසා නේද හදිසියෙ ගම ආවෙ?"

ඔහුට සිදුවූ සියල්ල කියන්නට සිතක් එකවරම ඇති වුව ද එය මැඩ ගන්නට ඇය සමත් විය. කිසිවකුට කිසිවක් නොකියා සිටීම නුවණට හුරු යයි ඇය සිතුවා ය. කිච්චාය කතිය සිදුවන සෙතක්ද නැත. මාසයක් දෙකක් යනවිට - සමහර විට එයටත් කලින් - මේ සියල්ල සමථයට පත් වී නැවත වැඩට යන්නට හැකි වනු ඇත. ඒ නිසා ඇත්ත නොකියා සිටීම මේ අවස්ථාවේ කළ හැකි සුදුසුම ක්‍රියාවකි.

"මොනා වෙන්නද අයියෙ..? මගෙ නිවාඩු ගොඩක් ඉතුරු වෙලා තිබුණා.. හදිසියෙම ආවා නෙවෙයි.. ඒත් තාත්තට කලින් කියන්න නං බැරිවුණා.."

ඔහු සිනාසෙමින් ඇය දෙස බැලුවේ ය. ඒ සිනාවේ බොහෝ දේ සැඟවී තිබුණි. ස්නේහාට හිතුණෝ එහෙමය. බොරු කියන්නට තමා ඒ තරම් දක්ෂ නැති බව ඈ දනියි. නොමැකුණ සිනාවෙන්ම ඉසුර ඇගේ ගමන් මල්ල ඇය අතට දුන්නේ ය.

"ටිකක් කතා කරන්න මං පහුවෙලා එන්නං නංගි.. මාමාට කියන්න මං ගියයි කියලා.." ඔහු කඩුල්ල පැන පාරට අවතීර්ණ වෙන අතරේ කීවේ ය.

**මතු සම්බන්ධයි**